# පෝතක බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් නිර්දේශය




**ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**
පෝතක බාලදක්ෂ හා වැඩ සටහන් අංශයේ ප්‍රකාශනයකි

# පෝතක බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් නිර්දේශය

## குருளைச்சாரணர் திறமைகாண் சின்னங்களுக்கான பாடத்திட்டம்

# CUB SCOUT PROFICIENCY BADGE SYLLABUS




ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02

දෙවන මුද්‍රණය 1996
තුන්වන මුද්‍රණය 2002
හතරවන මුද්‍රණය 2006
සංශෝධිත මුද්‍රණය 2019
සංශෝධිත මුද්‍රණය 2021

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

*මුල් පිටුව සහ ග්‍රැෆික් නිර්මාණය*
*එච්.චාමර සඳරුවන් කල්දේරා*
*සහය මූලස්ථාන කොමසාරිස්*


පෝතක බාලදක්ෂ පොරොන්දුව
குருளைச்சாரணர் சத்தியப்பிரமாணம்
CUB SCOUT PROMISE
මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට ද
පෝතක බාලදක්ෂ නීතියට කීකරු වීමට ද
දිනපතා යහපත් වැඩක් කිරීමට ද
මාගේ සම්පූර්ණ උත්සාහය යෙදීමට පොරොන්දු වෙමි
எனது மதம் மற்றும் நாட்டிற்கு கடமைகளை
நிறைவேற்றுவதற்கும்
சாரண விதிகளுக்கு கீழ்ப்படிவதற்கும்
தினம்தோறும் நற்பணியொன்றை செய்வதற்கும்
எனது முழுமையான முயற்சியில் ஈடுபடுவேன் என்று
உறுதியளிக்கின்றேன்.
I PROMISE TO DO MY BEST,
TO DO MY DUTY TO MY RELIGION AND COUNTRY,
TO OBEY THE CUB SCOUT LAW,AND
TO DO A GOOD DEED EVERY DAY.
CUB SCOUT LAW
1
පෝතක බාලදක්ෂයා ආකේලාට කීකරු වෙයි
குருளைச்சாரணர் ஆகேலாவுக்கு கீழ்ப்படிவார்
THE CUB SCOUT OBEYS AKELA
2
පෝතක බාලදක්ෂයා ප්‍රයෝජනවත් අයෙක් වෙයි
குருளைச்சாரணர் பயனுள்ளவாராக இருப்பார்
THE CUB SCOUT MAKES HIMSELF USEFUL
3
පෝතක බාලදක්ෂයා වඩාත් හොඳින් කිරීමට යත්න දරයි
குருளைச்சாரணர் மிக நன்றாக செய்வதற்கு முயற்சிப்பா
THE CUB SCOUT KEEPS TRYING TO DO BETTER

## හැඳින්වීම

බාලදක්ෂ ව්‍යාපාරයේ පුහුණු කිරීමේ කටයුතු සැලසුම් කිරීමේදී අධ්‍යාපන අරමුණු (06)ක් සාක්ෂාත් කර ගැනීම මූලික කොට සලකයි. ඒ අනුව පෝතක බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් ද සකස් කර ඇත. පෝතක අංශයේ දරු දැරියන් යහපත් පුරවැසියන් බවට පත් කිරීමට ප්‍රවීණතා පදක්කම් ඉවහල් වේ. දරුවන් තුළ සැඟවුණු කුසලතාවයන් එළිදක්වමින් අනාගතය කරා ඔවුන්ව සූදානම් කිරීමට ප්‍රවීණතා පදක්කම් ප්‍රබල පිටුවහලක් වේ. පෝතක බාලදක්ෂ දරුවන්ට නිසි ක්‍රමවේද අනුගමනය කරමින් ප්‍රවීණතා ලබා දීම පෝතක බාලදක්ෂ ආචාර්ය මහත්ම මහත්මීන්ගේ වගකීමකි.

## අධ්‍යාපන අරමුණු හය

| අංකය | අධ්‍යාපනික අරමුණු | පරමාර්ථ |
|---|---|---|
| 01. | **කායික** *Physical* | සෞඛ්‍ය සම්පන්නව සිටීමට අවශ්‍ය වන යහපත් පුරුදු සරල විනෝදාත්මක ක්‍රියාකාරකම් මගින් අවබෝධ කර ගනියි. |
| 02. | **බුද්ධිමය** *Intellectual* | විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අනාගත ආයෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණයට දැනුම ලබාගැනීම පිණිස විනෝදාත්මක කුතුහලයෙන් යුතු සරල ක්‍රියාකාරකම් මගින් අවස්ථා සලසා ගනියි. |
| 03. | **චිත්තවේග** *Emotional* | සමීප සබඳතාවයන්ගේ පැවැත්ම ගෞරවණීය ලෙස ආරක්ෂා කිරීමට අවශ්‍ය පුහුණුව විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් හුදුනා ගනියි. |
| 04. | **සමාජීය** *Social* | සමාජ සාරධර්ම පිළිබඳව ප්‍රාථමික දැනුම විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් අනුගමනය කරයි. |
| 05. | **ආධ්‍යාත්මික** *Spiritual* | නිර්මාණශීලි ක්‍රියාකාරකම් මගින් ආගමික හර පද්ධතීන් පිළිබඳව සරලව අවබෝධ කරගනියි. |
| 06. | **සංස්කෘතික** *Cultural* | සමාජ පැවැත්මට පාදක වන සංස්කෘතික අංශයන් පිළිබඳව සුමටව සරල ක්‍රියාකාරකම් ඔස්සේ අනුගමනය කරයි. |

## අධ්‍යාපන අරමුණු හය

### කායික

වාටිය කොළ පාට

- මලල ක්‍රීඩක
- පාපැදිකරු
- ක්‍රීඩක
- පිහිණුම්කරු
- වැඩකරු

### සංස්කෘතික

වාටිය තැඹිලි පාට

- චිත්‍ර ශිල්පි
- ජන නැටුම්කරු

### බුද්ධිමය

වාටිය නිල් පාට

- පොත් කියවන්නා
- නිරීක්ෂක
- විද්‍යාඥයා
- පරිගණක දැනුම

### ආධ්‍යාත්මික

වාටිය දුඹුරු පාට

- පසන් නිවැසි
- ආගමික

### චිත්තවේගීය

වාටිය දම් පාට

- සංගීතඥයා
- විනෝදකරු
- අත්වැඩකරු
- රැස්කරන්නා

### සාමාජීය

වාටිය රතු පාට

- සන්නිවේදක
- ප්‍රථමාධාරකරු
- මාර්ගෝපදේශක
- බලශක්ති සංරක්ෂක
- මිත්‍රත්වය
- ගෙවතු ගොවි
- නිවාස සහායක
- කුඩා ඉතිරි කරන්නා

### ජාත්‍යන්තර අංශය

- ☐ සොබාදම් ශූරයා
- ☐ සූර්ය ශක්තිය බලගන්වන්නා
- ☐ සාමයේ පණිවිඩකරු
- ☐ ප්ලාස්ටික් පිටු දකින්නා
- ☐ සාමයේ සංවාදකරු

# ප්‍රවීණතා පදක්කම් දිනා ගැනීම සඳහා උපදෙස් (2020.01.01 සිට)

★ ලෝකඩ තරුව සඳහා ''චිත්‍ර ශිල්පී'' හෝ ''පොත් කියවන්නා'' ප්‍රවීණතා පදක්කම අනිවාර්ය වේ.

- ලෝකඩ තරුව ලබා ගැනීමට පෙර අනිවාර්ය පදක්කමට අමතරව පහත සඳහන් ප්‍රවීණතා පදක්කම් වලින් 4 කට නොවැඩි ගණනක් දිනාගත හැකිය.
  සංගීතඥයා, විනෝදකරු, රැස්කරන්නා, පාපැදිකරු, මලල ක්‍රීඩක

- රිදී තරුව සඳහා නිවාස සහායක හා ගෙවතු ගොවි පදක්කම් අනිවාර්ය වේ.

- ප්‍රථමාධාරක, මාර්ගෝපදේශක, පසන් නිවැසි, බලශක්ති සංරක්ෂක, ජාත්‍යන්තර පදක්කම් හැර තවත් ප්‍රවීණතා පදක්කම් 06 ක් රිදී තරුව ලබා ගැනීමට පෙර කැමති නම් දිනා ගත හැකිය.

- රන් තරුව සඳහා පසන් නිවැසි, මාර්ගෝපදේශක හා ප්‍රථමාධාරක හෝ ජාත්‍යන්තර පදක්කම් වලින් එකක් යන ප්‍රවීණතා පදක්කම් 03 ක් දිනා ගැනීම අනිවාර්ය වේ.

- රන් තරුව දිනා ගැනීමට පෙර කලින් දිනාගත් ප්‍රවීණතා පදක්කම් වලට අමතරව තවත් ප්‍රවීණතා පදක්කම් 08 ක් දිනාගත හැකිය.

- රන් තරුව දිනාගැනීමෙන් පසුව ඉතිරි ප්‍රවීණතා පදක්කම් සියල්ලම වුවද කැමති නම් දිනාගත හැකිය. (වයස අවු. 11ට පෙර)

- සියළුම ප්‍රවීණතා පදක්කම් පළඳිනු ලබන්නේ දකුණු කමිස අතේය. එහෙත් ජාත්‍යන්තර පදක්කම් පමණක් පළඳිනු ලබන්නේ නිල් පාට උරපටිය මතය.

# කායික අංශය
## PHYSICAL SECTION
## (වාටිය කොළ පාට)

### පෝතක බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් සඳහා අවශ්‍යතා

### 01. මලල ක්‍රීඩක (Athlete)- CS / PH / 01

**අරමුණු :**

කායික ශක්තිය හා නිරෝගී බව වර්ධනය කරගනියි.

**අවශ්‍යතා :**




1. මීටර 75 ක් දිවීම.
2. සෙ.මී. 80ක් උස පැනීම.
3. මීටර් 2 1/2 ක් දුර පැනීම.
4. රබර් හෝ ටෙනිස් බෝලයක් මීටර් 20 ක් දුර විසිකිරීමට හැකිවීම.
5. මීටර 15 ක් දුර සිට විසිකළ රබර් හෝ ටෙනිස් බෝලයක් ඇල්ලීමට හැකිවීම.

(ළමයාගේ වයස හා ශාරීරික වර්ධන තත්ත්වය අනුව මෙම අවශ්‍යතා වල මට්ටම පරීක්ෂකවරයාට වෙනස් කිරීමට අවසරය ඇත.)

### 02. පාපැදිකරු (Cyclist) - CS / PH / 02

**අරමුණු :**

එදිනෙදා ජීවිතයට අවශ්‍ය වන පාපැදිය නිසි ලෙස භාවිතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. නියමිත ප්‍රමාණයේ පාපැදියක් (ළමයාගේ ප්‍රමාණයට සරිලන) පරීක්ෂකට පෙනෙන දුරක් පැද පෙන්වීම.
2. පා පැදියක නිසි ලෙස නැගීමට, එයින් බැසීමට හා නිවැරදි ලෙස ගාල් කිරීමට හැකි වීම.
3. පාපැදියක කොටස් නම් කිරීමට හැකිවීම.
4. පාරේ වාහන පදවන්නන් දැන සිටිය යුතු මාර්ග නීති හා සංඥා 05 ක් දැන සිටීම.

## 03. ක්‍රීඩක (Sportsman) - CS / PH / 03

**අරමුණු :**

තමාගේ කායික ශක්තිය වර්ධනය කරගනිමින් ක්‍රීඩා වලට අදාළ නිපුණතා ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. තමන් සහභාගි වන ක්‍රීඩා දෙකක් තෝරාගෙන ඒවායේ නීති රීති හා ක්‍රීඩා කරන ආකාරය පිළිබඳව පරීක්ෂකවරයාට/ වරියට පැහැදිලි කිරීම.

2. තමන් එම ක්‍රීඩාවලට සහභාගී වන බවට අදාළ ක්‍රීඩා භාර ගුරුතුමා /ගුරුතුමිය සහතික කළ ලිපියක් ඉදිරිපත් කිරීම.

3. තමන් සහභාගි වන ක්‍රීඩා වල ජාතික හා ජාත්‍යන්තර තලයට

## 04. පිහිණුම්කරු (Swimmer)- CS / PH / 04

**අරමුණු :**

පිහිනීම තුළින් සෞඛ්‍යය සම්පන්න පුද්ගලයකු බවට පත්වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. මීටර් 25 ක් දුර නිදහස් ආර (free style) පිහිනීමට හැකිවීම.

2. උඩුබැලි අතට මීටර් 15ක් පිහිනීම . (back stroke)

3. තාරා කිමිදීම උපයෝගී කරගෙන අඩි 4ක් පතුලේ ඇති යමක් රැගෙන මතුපිටට පැමිණීමට හැකිවීම. (Duck Dive)

## 05. වැඩකරු (Job Man)- CS / PH / 05

අරමුණු:-

නිවස තුළ හා පාසල තුළ ප්‍රයෝජනවත් අයකු ලෙස කටයුතු කිරීමේ නිපුණතාව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. පහත සඳහන් උපකරණයන්ගෙන් 05ක් ආරක්ෂිතව පරිහරණය කරන අන්දම හා එම උපකරණ ආරක්ෂා කරගන්නා ආකාරය ප්‍රදර්ශනය කිරීමට හැකි වීම. (මිටිය, අත් කියත, ඉස්කුරුප්පු නියන, ස්පැනරය, අඬු මිටිය, ටින් කටරය, කොස්ස, ඉදල)

2. සිය නිවසෙහි හෝ පෝතක කුටියෙහි ස්ථානයක් පිරිසිදු කිරීම. (උදා:- නිවසෙහි ඇඳ පිළියෙල කිරීම, පෝතක කුටියේ බිම මොප් (mop) කිරීම/සේදීම)

3. යම් භාණ්ඩයක් පින්තාරු කරන අන්දම ප්‍රදර්ශනය කිරීම. (උදා:- කුඩා මේසයක් හෝ පුටුවක්)

# බුද්ධිමය අංශය
## INTELLECTUAL SECTION
## (මාටිය තිල් පාට)

### 01. පොත් කියවන්නා (Book Reader& - CS / IN / 01

**අරමුණු :**

පොත් කියවීම තුලින් දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගනිමින් පොත් පත් මනාව පරිහරණය කිරීමටත් භාෂා කුසලතාව වර්ධනය කර ගැනීමටත් යොමු වෙයි.

**අවශ්‍යතා :**




1. පසුගිය මාස 06 තුළ කියවූ පොත් වර්ග හා එම පොත් කතුවරුන්ගේ නම් සඳහන් කර ලැයිස්තුවක් සෑදීම. (අවම පොත් 5) මේ පොත් අතරට, වීර කතා ආදර්ශ චරිත කතා, අපේ රටේ ඉතිහාස කතා, විද්‍යාත්මක ප්‍රබන්ධ කතා, පරිසරය පිළිබඳ කතා වලින් එකක් වත් ඇතුළත් විය යුතුය.
2. තමා විසින් සාදන ලද පොත් සලකුණක් :ඊදදන ඒරන* ඉදිරිපත් කිරීම.
3. පොත් ආරක්ෂා කර ගැනීම පිළිබඳව වාචිකව පරීක්ෂකවරයාට කරුණු ඉදිරිපත් කිරීම.
4. කුඩා කතාවක් තමා විසින්ම නිර්මාණය කර පොත් පිංචක් සාදා එහි පිට කවරයට තමාගේ චිත්‍රයක් යොදා ඉදිරිපත් කිරීම.
5. තමා ජීවත් වන ප්‍රදේශයේ හෝ පාසලේ පුස්තකාලයක සාමාජිකයෙක් වීම.

## 02. නිරීක්ෂක (Observer)- CS / IN / 02

**අරමුණු :**

පරිසරය සම්බන්ධ ශාක,සතුන්, පිළිබඳව සංවේදිතාවය හා පංචේන්ද්‍රියයන් මගින් දක්වන සංවේදිතාවය වර්ධනය කරගත් බව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. ගස් වර්ග 5 ක් හා මල් වර්ග 5 ක් හඳුනා ගැනීම හා කෙටි විස්තරයක් වාචිකව පරීක්ෂකවරයාට ඉදිරිපත් කිරීම්
2. සතුන්, කුරුල්ලන්,කෘමීන් හා මාළු යන වර්ග අතරින් එක් වර්ගයක 5 දෙනෙකු නිරීක්ෂණය කර ඔවුන්ගේ පෙනුම හා පුරුදු වාචිකව විස්තර කිරීම.
3. විනාඩි 02 ක් තුළ භාණ්ඩ 12 ක් දැකීමෙන් නිරීක්ෂණය කර මතකයෙන් අවම වශයෙන් ඒවායින් 09 ක් ලිවීම. (කිම් ගේ ක්‍රීඩාව)
4. පරීක්ෂකවරයා සකස් කරන ලද ඉන්ද්‍රිය පුහුණු ක්‍රීඩා 2 කට සහභාගී වීම (සුවඳ, ස්පර්ශය, ශබ්දය හා රස ඇසුරින්)

## 03. විද්‍යාඥයා (Scientist)- CS / IN / 03

අරමුණු :

විද්‍යාත්මක ක්‍රම පදනම් කරගනිමින් පරීක්ෂණ හා නිරීක්ෂණ තුළින් නිගමන වලට එළඹෙයි.

**අවශ්‍යතා :**




1. තමා විසින් තෝරාගත් තමා කැමති ඕනෑම සරල පරීක්ෂණ දෙකක් කර පෙන්වීම.
(තමා කළ පරීක්ෂණය කුමක්දැයි පරීක්ෂකවරයාට පැහැදිලි කළ යුතුය. පරීක්ෂණයෙන් පසුව ඔප්පු කළේ කුමක්දැයි විස්තර කිරීමට හැකි විය යුතුය.)

2. සුදු ආලෝකය විවිධ වර්ණ වලින් සෑදී ඇති බව පෙන්වීම.
3. උණකටුවක් භාවිතා කරන අන්දම පෙන්විම
4. පහත සඳහන් ඒවායින් එකක් තෝරාගෙන ඉදිරිපත් කිරීම.
   i. පෙරිස්කෝපයක් (Periscope) සාදා එය ක්‍රියා කරන අන්දම පරීක්ෂකවරයාට පහදා දීම.
   ii. සරල විද්‍යුත් පරිපථයක් සාදා එය ක්‍රියා කරන අන්දම විස්තර කිරීම.
   iii. චුම්බකයක් භාවිතා කර සරල නිර්මාණයක් කිරීම.
   iv. හරිතප්‍රද (ක්ලෝරපිල්) සෑදීමට ශාක වලට හිරු එළිය අවශ්‍ය බව පෙන්වීම.

## 04. පරිගණක දැනුම (Computer Knowledge)- CS / IN / 04

**අරමුණු:**

පරිගණක භාවිතය පිළිබඳව සරල- දැනීම භාවිතා කරයි.

**අවශ්‍යතා :**




1. පරිගණකයේ ප්‍රධාන කොටස් නම් කිරීමට හැකි වීම.
2. පරිගණකය පණ ගැන්වීමට හැකි වීම.
3. 'Document" එකක් සෑදීමට හැකිවීම.
4. ගොණුවක් (Folder) සෑදීමට සහ නම් කිරීමට හැකිවීම
5. එම ගොණුව (Folder) ක්‍රියාකරවීමට හැකිවීම.
6. පෙර සෑදූ ගොණුව නැවත විවෘත කිරීමට හැකිවීම.
7.. File" එකක් සහ "Folder" එකක් නැවත නම් කිරීමට (Rename) කිරීමට හැකිවීම.

# චිත්තවේගීය අංශය
## EMOTIONAL SECTION
## (වාටිය දම් පාට)

### 01. සංගීතඥයා (Musician)- CS / EM / 01

**අරමුණු :**

පෝතක බාලදක්ෂයා තුළ ඇති සංගීතමය හැකියාව පෙන්නුම් කරයි.

**අවශ්‍යතා :**




1. සංගීතයෙහි ස්වර සප්තකය ගායනා කිරීම (මේ සඳහා සංගීත භාණ්ඩයක වාදන ඇසුර ලබා ගැනීමට අවසර ඇත.
2. සංගීත භාණ්ඩ 03ක් නම් කිරීමට හැකිවීම
3. අංග චලන සහිතව ළමා ගීතයක් ගායනා කිරීම.
4. නාට්‍ය ගීතයක් ගායනා කිරීම
5. විදේශීය බාලදක්ෂ ගීතයක් ගායනා කිරීම.
6. සංගීත භාණ්ඩයක් වාදනය කිරීම.

### 02. විනෝදකරු (*Entertainer*)- *CS / EM / 02*

**අරමුණු :**

තමාගේ කුසලතාවයන් යොදා ගනිමින් අන් අය විනෝදමත් කරවයි.

**අවශ්‍යතා :**

පහත සඳහන් දේ වලින් 3ක් සතුටුදායක ලෙස හිම කිරීමට හැකිවීම (මේ එකක් සඳහා අවම වශයෙන් විනාඩි 3ක් ගත කළ යුතුය)




1. සංගීත භාණ්ඩයක් වාදනය කිරීම.
2. ගායනය (දේශාභිමානී ගීතයක්, ජන ගීයක් හා ජනප්‍රිය ගීතයක් ගායනා කළ යුතු වේ)
3. නර්තනයක්
4. අභිරූපන රංගනයක්
5. මෙෆට් හෝ රූකඩ රංගනයක්
6. විකට කථාවක් රඟ දැක්වීම

## 03. අත්වැඩකරු (Handicraftman)- CS / EM / 03

**අරමුණු :**

හසුරු කෞශල්‍ය තුළින් නව නිර්මාණාත්මක හැකියාව පෙන්නුම් කරයි.

**අවශ්‍යතා :**




1. ඉවත දමන ලද දෙයින් ප්‍රයෝජනවත් යම් භාණ්ඩයක් පරීක්ෂකවරයා ඉදිරියේ සෑදීම
   (උදා:- බිත්ති සැරසිල්ලක්, සුබ පැතුම් පතක්)
2. මැටි වලින් හෝ වෙනත් දෙයකින් රූපයක් ඇඹීම.
3. ගස්වල මුල්,ලී,ලණු,සිප්පිකටු,ගොක් කොළ, පස් වර්ග වැනි ස්වාභාවික ද්‍රව්‍යයන් භාවිතා කර ප්‍රයෝජනවත් සැරසිල්ලක්/ භාණ්ඩයක් සෑදීම.

## 04. රැස්කරන්නා (Collector)- CS / EM / 04

**අරමුණු :**

විවේක කාලය තුළ නොයෙක් දේ රැස් කිරීමෙන් දැනුම හා විනෝදය නිසි ලෙස ලබා ගන්නා බව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




පහත සඳහන් දේ වලින් එකක් මාස 03ක් පමණ අඛණ්ඩ කාලයක් තුළ එකතු කර සංරක්ෂණය කළ බව පරීක්ෂකවරයාට ඒත්තු ගැන්වීම.

1. තමාගේ එකතුව මගින් ලබාගත් දැනුම පිළිබඳ පරීක්ෂකවරයාට වාචිකව විස්තරයක් ඉදිරිපත් කළ යුතුය. තමා තෝරා ගත් අංශයෙන් විවිධ වූ එකතුවක් විය යුතුය.

පහත සඳහන් අංශ වලින් එක් අංශයක්පමණක් තෝරා ගෙන ඒ අංශයෙන් විවිධ වූ එකතුවක් පරීක්ෂකවරයාට පෙන්විය යුතු ය.

එක වර්ගයකින් එකක් වන සේ විවිධ විය යුතුය. එකතුවේ අවම සංඛ්‍යාව වරහන් තුළ දක්වා ඇත.

- ඡයාරූප එකතුවක් (20)
- මුල් දින කවර එකතුවක් (05ක්)
- පින්තූර කාඩ්පත් වල එකතුවක් (50ක්) (Picture Post Card)
- ලේබල් වර්ග එකතුවක් (30ක්)
- පෑන් වර්ග එකතුවක් (25)
- කාසි වර්ග එකතුවක් (25)
- පිහාටු වර්ග එකතුවක් (20)
- ධාන්‍ය, ඖෂධ හෝ ඇට වර්ග එකතුවක් (20)
- වෙළඳ සලකුණු වැනි දේවල්වල එකතුවක් (10)
- මුද්දර එකතුවක් (100)
- විවිධ සෙල්ලම්බඩු එකතුවක් (20)
- ජාතික වීරයන්/නායකයන් පිළිබඳ තොරතුරු, පින්තූර (10)
- දේශීය හා විදේශීය කඳු, ගංගාවල පින්තූර එකතුවක් (10)
- පදක්කම්වල (විවිධ) එකතුවක් (15)

මීට අමතරව පරීක්ෂකවරයාට සෑහිමකට පත් විය හැකි වෙනත් දේවල් එකතුවක් ද ඉදිරිපත් කළ හැකිය.
මෙම එකතුව පෝතක බාලදක්ෂයාගේ බව පෝතක බාලදක්ෂ ආචාර්යවරයා/වරිය නිර්දේශ කළ යුතුය.

# සමාජීය අංශය
## SOCIAL SECTION
## (වාටිය රතු පාට)

### 01. සන්නිවේදක (Communicator) - CS / SO / 01

**අරමුණු :**

තොරතුරු නිසිලෙස සන්නිවේදන කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා:-**




1. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන අදහස් හුවමාරු කරගැනීමේ ක්‍රම දෙකක් දැන සිටීම.
2. දෙන ලද මාතෘකාවක් හෝ පණිවිඩයක් සන්නිවේදනය කිරීම සඳහා පෝස්ටරය ක් නිර්මාණය කිරීම.
3. නිවේදකයකු ලෙස ක්‍රියා කිරීම (ප්‍රවෘත්ති / ක්‍රීඩා විචාරකයකු ලෙස විනාඩි 02ක් පමණ)
4. පරීක්ෂකවරයා විසින් දෙනු ලබන ඡායාරූපයකට අදාළ වන විස්තරයක් වාචිකව විස්තර කිරීම.
5. ස්ථාවර හා ජංගම දුරකථන නිසි ලෙස භාවිතා කර අදහස් හුවමාරු කිරීමට හැකිවීම.

### 02. ප්‍රථමාධාරකරු (First Aider)- CS / SO / 02

**අරමුණු:-**

අනතුරකදී අන් අයට උදව් කිරීමේ කුසලතාවය භාවිතා කරයි.

**අවශ්‍යතා:-**




1. ප්‍රථමාධාර යනු කුමක්ද යන්න අර්ථ දැක්වීම හා වැඩිහිටි උපකාර ලබා ගත යුතු අවස්ථා ගැන දැන ගැනීම හා ප්‍රථමාධාර කරුවෙකු තුළ තිබිය යුතු ගුණාංග දැන සිටීම.

2. සුළු කැපීම් හා සීරීම් තුවාලවලට ප්‍රතිකාර කරන අන්දම දැන සිටීම.
3. දිග වෙලුම් පටි පාවිච්චි කරමින් අල්ල හා දණහිස වෙළන ආකාරය පෙන්වීම.
4. මහ උරමාව දැමීමට හැකිවීම.
5. පිළිස්සීම් විය හැකි අයුරු දැන සිටීම හා නිවසේ දී විය හැකි පිළිස්සීම් වලදී ප්‍රතිකාර දැන සිටීම
6. නාසයෙ න් හා මුඛයෙන් ලේ ගැලීමේදී කළ යුතු ප්‍රථමාධාර දැන සිටීම.

## 03. මාර්ගෝපදේශක (Guide) - CS / SO / 03)

**අරමුණු :**

එදිනෙදා ජීවිතයේදී අවශ්‍ය අවස්ථා වලදී මගපෙන්වන්නකු ලෙස ක්‍රියා කිරීමේ හැකියාව භාවිතා කරයි.

**අවශ්‍යතා :**




1. කිසියම් ස්ථානයක් පිළිබඳ විමසන අමුත්තෙකුට ආචාරශීලිව හා නිවැරදිව එම ස්ථානය පිළිබඳව කියා දීමට හැකිවීම.
2. පදිකයකු පිළිපැදිය යුතු මාර්ග සංඥා 5ක් චිත්‍ර ගත කර නම් කිරීම.
3. පාරේ ගමන් කළයුතු ආකාරය පරීක්ෂකවරයාට/වරියට පැහැදිලිව ඉදිරිපත් කිරීම.
4. තමාගේ නිවස අසල ඇති වැදගත් ස්ථාන 03 ක් පිළිබඳව වාචිකව විස්තර ඉදිරිපත් කිරීම.
5. අදාළ ප්‍රදේශය තුලින් ගමන් ගන්නා බස් රථ වල ආරම්භය, ගමනාන්තය හා මාර්ග අංක නම් කිරීම. (උපරිම 5 ක්)
6. පාසලේ සිට තමාගේ නිවසට ගමන් ගන්නා මාර්ගය පිළිබඳ විස්තර කිරීම.

## 04. බලශක්ති සංරක්ෂක (Power and energy conservator) CS / SO / 04

**අරමුණු**

බලශක්ති ප්‍රභවයන් සකසුරුවමින් පරිහරණය කිරීමට යොමු වෙයි.

**අවශ්‍යතා :**




1. බලශක්තිය යනු කුමක්දැයි සරලව හැඳින්වීමට සහ ප්‍රාථමික ශක්ති ප්‍රභව 4ක් නම් කිරීමට හැකිවීම.
2. ද්විතික ශක්තීන් යනු කුමක්දැයි සරලව හැඳින්වීමට සහ ද්විතියික ශක්ති ප්‍රභවයක් ලෙස විදුලිය නිපදවා ගැනීමට භාවිතා කරන ක්‍රම 3ක් නම් කිරීමට හැකිවීම.
3. ප්‍රාථමික ශක්තීන් ද්විතික ශක්තීන් බවට පරිවර්තනය කරන ආකාර දැක්වීමට සරල ආකෘති නිර්මාණය කිරීම.
4. එදිනෙදා ජීවිතයේ බහුලව පරිහරණය කරන ශක්තිය ඇසුරෙන් අපතේ යෑම පිළිබඳව පරීක්ෂකවරයා සමග සාකච්ඡා කරන්න.
5. ශක්තිය අපතේ යාම අවම වන පරිදි ආරක්ෂාකාරීව පරිභෝජනය කළ හැකි ආකාර පිළිබඳව පරීක්ෂකවරයා සමග සාකච්ඡා කරන්න.

## 05. මිත්‍රත්වය (Friendship)- CS / SO / 05

**අරමුණු :**

පුද්ගලයන් අතර එකිනෙකා කෙරෙහි දක්වන සුහදතාවය ප්‍රදර්ශනය කරයි.

(




**අවශ්‍යතා :**

1. වෙනත් රැළක (තම දිස්ත්‍රික්කයේ හෝ වෙනත් දිස්ත්‍රික්කයක විය හැකියි) හෝ විදේශ රටක පෝතකයකු සමග මිතුරු සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම. අවම වශයෙන් මාස 03ක් මෙය ලිපි හුවමාරුවකින් හෝ අන්තර්ජාලය මගින් ද විය හැකියි. අන්තර්ජාලය භාවිතා කිරීමේදී වැඩිහිටි අධීක්ෂණය අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.)
2. යහළුවන් සමග සුහදව ඇසුරු කරන බව පරීක්ෂකවරයාට/වරියට ඒත්තු ගැන්වීම (පාසලේදී, නිවසේදී හෝ

## 06. ගෙවතු ගොවි (Gardner)- CS / SO / 06

**අරමුණු :**

ගෙවතු වගාවට අවශ්‍ය උපකරණ හා වගා ක්‍රම හඳුනා ගනිමින් කටයුතු කිරීම අර්ථවත් කරයි.

**අවශ්‍යතා:-**




1. මීටර් 2×2 ප්‍රමාණයේ වර්ග මීටර 4ක පාත්තියක් සකස් කර එහි මාස 2ක් පමණ කාලයක් යමක් වැවීම සහ රැක බලා ගැනීම නාගරික පෝතක රැල වලට පහත සඳහන් දේ කළ හැකිය. ඇට තවානක් දමා සකස් කල පැළෑටි වර්ග 03ක් මාස 3ක කාලයක් මල් පෝච්චි වල හෝ වගාවට සුදුසු බඳුන් හෝ විකල්ප ඇසුරුම් වල වවා රැක බලා ගැනීම හා ආරක්ෂා කිරීම.
2. ගොවිතැනට භාවිතා කරන ආවුද/උපකරණ 5ක් නම් කර ඒවා භාවිතා කරන අන්දම ප්‍රකාශ කිරීම උදා:- උදැල්ල, පාමුල්ලුව අත්මුල්ලුව, පිහිය, රේක්කය, අලවංගුව, විසිකැත්ත, මල් බාල්දිය,
3. වත්තේ වැවෙන මල් වර්ග 3 ක් හා එළවළු වර්ග 3ක් නම් කිරීමට හැකි වීම.
4. පරීක්ෂකවරයා සමඟ සාකච්ඡා කරමින් පහත සඳහන් දෑ නම් කිරීමට හැකිවීම
   අ. සාමාන්‍ය වල් පැළෑටි තුනක්.
   ආ. ගෙවත්තේ වගාවට හානිකරන සතුන් තිදෙනෙකු

## 07. නිවාස සහායක (House Orderly) - CS / SO / 07

**අරමුණු :**

තමා ජීවත්වන නිවසේ වැඩකටයුතු වලට සහය වෙයි.




**අවශ්‍යතා :**

1. තේ හෝ කෝපි කෝප්පයක් පිළියෙල කිරීම.
2. සැන්ඩ්විච් එකක් පිළියෙල කිරීම.
3. බතල හෝ මඤ්ඤොක්කා වැනි අල වර්ගයක් තම්බා පෙන්වීම.

4. ගෙබිම පිරිසිදු කරන ආකාරය හා ජනෙල් දොරවල්වල දූවිලි පිසදැමීම.
5. රිදී හෝ පිත්තල භාණ්ඩයක් පිරිසිදු කිරීම.
6. ආහාර සැකසීමට භාවිතා කරන ලද බඳුන්, කෘත්‍රිම හෝ ස්වාභාවික පිරිසිදුකාරකයක් හෝ භාවිතා කර පවිත්‍ර කරන අන්දම.

## 08. කුඩා ඉතිරි කරන්නා (Little Saver)- CS / SO / 08

අරමුණු :

මුදල් ඉතිරි කිරීමේ වැදගත්කම ගැන අවබෝධයක් දීම සහ අනවශ්‍ය වියදම් අඩු කරගැනීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

අවශ්‍යතා :




1. රු 100/- ක අවම මුදලක් තැන්පත් කරමින් ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම
2. ක්‍රමානුකූලව ඉතිරි කිරීමෙන් අනාගත ජීවිතයට සහයක් ලැබෙන ආකාරය පිළිබඳව පරීක්ෂවරයාට විස්තර කිරීම
3. ආසන්න මාස 3 ක කාලයක් තුළ ඉතිරි කිරීමේ වර්ධනයක් ඇති වූ බව පෙන්නුම් කිරීම
4. ඔබේ දෙමාපියන් ඔබ වෙනුවෙන් අනවශ්‍ය වියදම් කිරීමේ ආකාර තුනක් නවතා ඒ වෙනුවට එම මුදල් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කිරීම කළ හැකි බව පරීක්ෂකවරයාට පැහැදිලි කිරීම.

5. නිවසේ දී පිළියෙළ කර ගත් ආහාර භුක්ති විදීම ක්ෂණික ආහාර භුක්ති විදීමට වඩා උචිත බව මෙන්ම එමගින් සෞඛ්‍ය ප්‍රශ්න වළකන, අනවශ්‍ය මුදල් වියදම් වළකන ආකාරය පරීක්ෂකවරයා සමග සාකච්ඡා කිරීම.

# ආධ්‍යාත්මික අංශය

## SPIRITUAL SECTION

## (වාටිය දුඹුරු පාට)

### 01. පසන් නිවැසි (Happy Home)- CS / SP / 01

අරමුණු:-

පවුල තුළ හා ඥාතීන් අතර මනා සම්බන්ධතා පවත්වා ගත් අයෙකු ලෙස ජීවත් වෙයි.

අවශ්‍යතා :




1. තමා පසුගිය මාසය තුළ ගේ දොර කටයුතු වලට සහය දුන් අන්දම පිලිබඳ වාර්තාවක් සකස් කර ආකේලාට ඉදිරිපත් කිරීම. (මෙය මව හෝ පියා හෝ භාරකරු විසින් සහතික කළ යුතුය.)
2. මව හෝ පියා ගැන හෝ ඔවුන් දෙදෙනාම ජීවත්ව නොමැති නම් පෝතක බාලදක්ෂයා වඩාත් කැමති වැඩිහිටියෙකුගේ යහපත් ගතිගුණ 5 ක් ලිවීම.
3. පෝතක බාලදක්ෂයාගේ පවුලේ ආසන්න ඥාතීන් හා ඔවුන්ගේ ඥාති සම්බන්ධය ගැන ඡායාරූප මගින් හෝ චිත්‍ර මගින් සටහනක් ඉදිරිපත් කිරීම.
4. ආකේලාගේ උපදෙස් පරිදි පෝතක බාලදක්ෂයා ගෙදරදී උපකාර වන බවට හා ප්‍රයෝජනවත් ලෙසත් ප්‍රසන්න ලෙසත් කටයුතු කරන බවට සුහද සාකච්ඡාවක් පැවැත්වීම මගින් ආකේලා සෑහීමකට පත්වීම.

   (මෙහි පරීක්ෂකවරයා ලෙස කටයුතු කරන්නේ පෝතක රැළ භාර පෝතක බාලදක්ෂ ආචාර්යතුමා හෝ තුමිය විසිනි)

## 02. ආගමික (Religious)- CS / SP / 02

**අරමුණු :**

තමාගේ ආගම පිළිබඳව විශේෂ දැනුමක් හා වෙනත් (අන්‍ය) ආගම් පිළිබඳ සාමාන්‍ය දැනීමක් ඇතිව ආගමික කටයුතුවල නිරත වෙයි

**අවශ්‍යතා :**




1. තමාගේ හා අන්‍ය ආගමික සංකේත පිළිබඳ අවබෝධයක් තිබීම.
2. තමන්ගේ ආගමට අයත් ආගමික ස්ථානයක හැසිරෙන පිළිවෙත අවබෝධ කරගැනීම හා ප්‍රායෝගිකව ඉටු කිරීම.
3. තම ආගමේ ආගමික වතාවත් පිළිබඳව මනා අවබෝධයක් තිබීම හා අවම වශයෙන් වතාවත් දෙකකට සහභාගී වීම
4. ආගමික ස්ථානයක පැය 1/2 ක පමණ සතුටු සේවාවක නියැලීම.
5. තමන්ගේ ආගමට අයත් පොත් දෙකක් කියවා ඒවායේ අඩංගු කරුණු පිළිබඳව පරීක්ෂකවරයා විමසන සරල ප්‍රශ්න වලට සාර්ථක ව පිළිතුරු දීම.

# සංස්කෘතික අංශය
## CULTURAL SECTION
## (වාටිය තැඹිලි පාට)

### 01. චිත්‍ර ශිල්පී (Artist)- CS / CU / 01

**අරමුණු :**

මූලික වර්ණ හඳුනා ගනිමින් සංයමයෙන් යුතුව නිර්මාණයක් කිරීමේ හුරුව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. මූලික වර්ණ 03 හඳුන්වා දී ( නිල්, කහ, රතු) ඒවා මිශ්‍ර කිරීමෙන් විවිධ වර්ණ ලැබෙන බව පෙන්වීම.
2. අවම වශයෙන් මාස 02ක් පමණ කාලයක් තුළ තමා විසින් නිර්මාණය කරන ලද චිත්‍ර 10ක පමණ එකතුවක් පරීක්ෂකවරයාට ඉදිරිපත් කිරීම.
3. පරීක්ෂකයා විසින් දෙනු ලබන මාතෘකාවට අනුව පැන්සලෙන්, පැස්ටල් කූරකින් හෝ තමා කැමති ඕනෑම මාධ්‍යයකින් චිත්‍රයක් ඇඳ පෙන්වීම.

### 02. ජන නැටුම්කරු (Folk Dancer)- CS / CU / 02

**අරමුණු**

අතීත උරුමය පිළිබඳ හැඟීම හා ජනනැටුම් පිළිබඳ නර්තනමය හැකියාව ප්‍රදර්ශනය කරයි.

**අවශ්‍යතා :**




1. ජන නැටුම් වර්ග 03 ක් නම් කිරීම හා ඒවාට අදාළ ජන ගායනයන් දැන සිටීම.
2. අදාළ ඇඳුම, භාණ්ඩය සහ ගායනය සහිතව පරීක්ෂකවරයා සතුටු වන අන්දමට කණ්ඩායමක් සමඟ හෝ තමා පුහුණු වී සිටින ජන නැටුම රඟ දැක්වීම (මෙහිදී සරල චලන සමඟ මැන්ඩිය භාවිතා කළ යුතුය.)

# ජාත්‍යන්තර අංශය
# INTERNATIONAL SECTION

## සොබාදම් ශූරයා
## Champions for Nature Challenge (Cub Scouts)

### අවධානයට

(1) රිදී තරුව දිනා ගැනීමෙන් පසුව ලබාගත හැක.

(2) 

පදක්කම් පරීක්ෂකවරයාගේ සහය ලබාගෙන මානව වර්ගයා සොබාදහම හා ජෛව විවිධත්වය අතර අන්තර් සම්බන්ධතාවය හා සැබෑදි පෝතක බාලදක්ෂයා සතු දැනුම පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ කළ යුතුය. (මෙහිදී සෑම පියවරකදීම පෝතක බාලදක්ෂයාට මගපෙන්වීම,පෙළඹවීම හා උපකාර කිරීම කළ යුතුයි

(3) පහත දැක්වෙන ක්‍රියාකාරකම් වලින් 2ක බැගින් තෝරා ක්‍රියාත්මක කර පෙන්වීම.(පරීක්ෂක සහාය ලබාගෙන)

### ක්‍රියාකාරකම් ලයිස්තුව

වඩාත් යහපත් මග තෝරා ගැනීම

(a) කාබන් පියසටහන් පිරික්සුම් ලයිස්තුව

(b) ඔබගේ පරිසර හිතකාමී ජීවිතය

(c) රතු හෝ කොළ

### සොබාදහම් හා ජෛව විවිධත්ව මග

(a) ආගන්තුක ශාක හා සතුන් නිසා පරිසරයට ඇති වන බලපෑම

(b) Inaturalist යෙදුම (app) හරහා සොබාදහම් ගවේෂණය

(c) bio blitz- ස්වභාවික ප්‍රදේශ ගවේෂණය

(d) සොබා දහම කෙරෙහි අවම බලපෑම

## සහභාගිත්වය (සැලසුම් අවධිය)

- පදක්කම් පරීක්ෂකවරයාගේ සහ පෝතක බාලදක්ෂ නායකයාගේ සහාය ඇතිව (උපරිමය පෝතක බාලදක්ෂයන් 12-හයවල් 2) සහභාගිත්වය පරිසරයට සම්බන්ධ සතුටු සේවා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.(සෑම පොතක බාලදක්ෂයෙකුගේම දායකත්වය සේවා පැය 4ක් විය යුතුය.)

I. ඔබගේ ප්‍රදේශයේ පාරිසරික ගැටලු සහ අවශ්‍යතා හඳුනා ගැනීම
II. ඔබගේ ප්‍රදේශයේ පාරිසරික ගැටලු වලට දියහැකි පිළියම් ගවේෂණය කිරීම. (අනිකුත් පෝතක බාලදක්ෂයින් සමග එක්ව)
III. ප්‍රජා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සාධන සැලසුමක් නිර්මාණය කිරීම

## ක්‍රියා

- සේවා ව්‍යාපෘතිය සඳහා එකඟ වන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම
- තමන් විසින් කරන ලද සේවා ව්‍යාපෘතිය පිළිබඳව වාචික ප්‍රකාශයක් පදක්කම් පරීක්ෂකවරයාට ලබා දීම
- පෝතක බාලදක්ෂ නායකයාගේ සහය ඇතිව ව්‍යාපෘතිය වෙබ් පිටුවේ පළ කිරීම. :ඇඇඇගිප්දමඑගදරට*

## පදක්කම් ප්‍රදානය

අදාල දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශ සහිතව දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරියා විසින් ආදර්ශ පත්‍රිකාව ජාතික මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර SWA සම්බන්ධීකරණ විසින් පදක්කම සහ සහතික පත්‍රය නිකුත් කරනු ඇත. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා නොමැති විට සහාය දිසා කොමසාරිස් (වැඩ සටහන්) විසින් ආදර්ශ පත්‍රිකාව (වාර්තා) ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත භාර දිය යුතුය.

# සූර්ය ශක්තිය බලගන්වන්නා

## Scouts Go Solar Challenge

අවධානයට

1. රිදී තරුව දිනා ගැනීමෙන් පසුව දිනා ගත හැක.
2. මෙහි සෑම පියවරකදීම පදක්කම් පරීක්ෂක විසින් පෝතක මගපෙන්වීම,පෙළඹවීම, උපකාරකිරීම කළ යුතුයි




අවශ්‍යතා

1. සූර්යයා, සූර්ය ශක්තිය, සූර්ය ශක්තියේ භාවිතා පිළිබඳ මූලික දැනුම.
2. සෞඛ්‍යය හා පරිසරයට සූර්යයාගෙන් ඇති වන අහිතකර බලපෑම් පිළිබඳ පැහැදිලි කිරීම.
3. සූර්යාධික දිනයක ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වීමට පෙර ගත යුතු ආරක්ෂිත ක්‍රමෝපායන් පිළිබඳ දැනගැනීම.
4. සූර්ය ශක්තියෙන් ලබාගත හැකි ප්‍රයෝජන අධ්‍යනය හා සූර්ය ශක්තිය උත්පාදනය කිරීම සඳහා භාවිතා කරන තාක්ෂණය පිළිබඳ දැනගැනීම.
5. පහත දැක්වෙන කාණ්ඩ වලින් 2 බැගින් ක්‍රියාත්මක කර පෙන් වීම.

 සූර්යයා ජීවිතයයි - ක්‍රියාකාරකම් ලයිස්තුව

- ආලෝකය ලුහුබැඳීම
- සූර්ය කලා
- සෙවනැලි හෝරා
- සූර්ය ශක්තියේ වර්ණ

 සූර්යයාගෙන් සෞඛ්‍යයට හා පරිසරයට ඇති වන බලපෑම

- අව් කණ්නාඩි
- හිරු එළියේ පිලිස්සීමෙන් වැලකීම

 සූර්ය ශක්තිය ප්‍රයෝජනයට ගැනීම- ක්‍රියා

- සූර්ය ශක්තියේ භාවිත -ක්‍රියාවන්
- සූර්ය තාප උදුන (අනිවාර්යෙන්)
- සූර්ය ශක්තිය එක් දිනක්- හැමදාම
- ජලය රැස්කිරීම

 සූර්ය ශක්තිය බලගන්වන ක්‍රියා

- සූර්ය ශක්තිය උදව්වෙන් (ආහාර 3) දිවා ආහාරයක් පිළියෙල කිරීම.
- පිරිසිදු ජලය භාවිතය.
- රත් වූ ජලය ස්නානය කිරීම.

# සාමයේ පණිවිඩකරු

## Messengers of Peace - Ring Badge Criteria

රිදී තරුව දිනා ගැනීමෙන් පසුව දිනා ගත හැක.

**1. දිරි ගැන්වීම**

පහත දැක්වෙන දේ වලින් එකක් පිළිබඳව පොතක බාලදක්ෂ දිරිගැන්වීම.

- එදුව මගින් සංවිධානය කරන ලද වැඩසටහනක් (පෝතක රැළ/ බාලදක්ෂ කණ්ඩායම/ දිසා හෝ ජාතික මට්ටම) නිරීක්ෂණය කිරීම.
- එදුව දිසා සම්බන්ධීකාරක/ සහය දිසා කොමසාරිස් (වැඩසටහන්)/ සහය දිසා කොමසාරිස් (පෝතක)/පෝතක බාලදක්ෂ නායක විසින් ඒ සම්බන්ධ කරන කතාවක් හෝ වාර්තාමය වැඩසටහනක් නැරඹීම.

**2. ඉගෙනුම හා තීරණ ගැනීම**

- පෝතක බාලදක්ෂයා සම්බන්ධ වීමට කැමති ව්‍යාපෘතියක් පිළිබඳව හැදෑරීම හා තීරණය කිරීම.(මෙහි විෂය පථය පෝතක බාලදක්ෂයා දිරිගන්වන සුළු එකක් විය යුතුය) (තිරසර සංවර්ධන ඉලක්ක-SDG සපුරා ගත හැකි වචන පරිදි)
- අදාල සතුටු සේවයේ ව්‍යාපෘති සැලැස්ම පිළිබඳව වාචික වාර්තාවක් පෝතක බාලදක්ෂයා නායකයා වෙත ඉදිරිපත් කිරීම
- පෝතක බාලදක්ෂ නායකයා විසින් සහය දිසා කොමසාරිස් (පෝතක) මගින් යෝජිත ව්‍යාපෘති ආකෘතිය දිස්ත්‍රික් එධජ සම්බන්ධීකාරක වෙත ඉදිරිපත් කළ යුතුය. (ව්‍යාපෘති ආකෘතිය අමුණා ඇත)

3. කරන්න.

- සේවා කාලය පැය 2කට නොඅඩු කාලයක් ගත කරමින් සතුටු සේවා ව්‍යාපෘතියක් සංවිධානය කරන්න.(පෞද්ගලික)
සහ
- සේවා පැය 4කට නොඅඩු කාලයක් ගත කරමින් සතුටු සේවා ව්‍යාපෘති 2 කට සහභාගී වන්න (පෞද්ගලිකව)

4. ඉදිරිපත් කරන්න

- ව්‍යාපෘතියේ සාර්ථක බව පෝතක බාලදක්ෂ නායක වෙත වාචිකව ඉදිරිපත් කිරීම.

- පෝතක බාලදක්ෂ නායක/ පදක්කම් පරීක්ෂක විසින් www.scout.org වෙබ් අඩවියට ඉහත වාර්තාව උඩු ගත කර එම වාර්තාව දිසා එදව සම්බන්ධීකාරක වෙත ස.දි.කො. (පොතක) මගින් ඉදිරිපත් කරන්න.

දිස්ත්‍රික් එදව සම්බන්ධීකාරක නොමැති විට සහය දිසා කොමසාරිස් (වැඩ සටහන්) වෙත වාර්තා ඉදිරිපත් කළ හැක.

**පදක්කම් ප්‍රදානය**

අදාල දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශ සහිතව දිස්ත්‍රික් එදව සම්බන්ධීකරණ නිලධාරියා විසින් ආදර්ශ පත්‍රිකාව ජාතික මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර එදව සම්බන්ධීකරණ විසින් පදක්කම සහ සහතික පත්‍රය නිකුත් කරනු ඇත.
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා නොමැති විට සහාය දිසා කොමසාරිස් (වැඩ සටහන්) විසින් ආදර්ශ පත්‍රිකාව (වාර්තා) ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත භාර දිය යුතුය.

# ප්ලාස්ටික් පිටු දකින්නා

## *Tide Turners Plastic Challenge*

1. රිදී තරුව දිනා ගැනීමෙන් පසුව දිනා ගත හැක.

2. පදක්කම් පරීක්ෂකවරයා පෝතක බාලදක්ෂයාට මේ සඳහා මඟ පෙන්වීම හා සහාය ලබාදිය යුතුය.

### දැනුවත් වීම




1. ප්ලාස්ටික්,ප්ලාස්ටික් අපද්‍රව්‍ය,ප්ලාස්ටික් මඟින් පරිසරය දූෂණය ගැටලු පිළිබඳව පෝතක බාලදක්ෂයන්ගේ අවබෝධය ස්වයං ඇගයීමකට ලක් කිරීම.

2. පෝතක බාලදක්ෂයාගේ දෛනික ජීවිතයේ ප්ලාස්ටික් භාවිතය නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රශ්න කිරීම.

3. ජල සහ භූමි පරිසර පද්ධතියේ දූෂණය වලක්වා ගැනීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන හිරොගී පෘථිවි ක්‍රියාකාරකම් ලයිස්තුවෙන් 5ක් තෝරා ක්‍රියාත්මක කිරීම

### ක්‍රියාකාරකම් ලයිස්තුව

(a) ඔබගේ ප්ලාස්ටික් භාවිත පුරුදු විගණනයට ලක් කිරීම
(b) චිත්‍රපටි රාත්‍රිය
(c) පරිගණක ක්‍රීඩාව උදාහරණ සාගර විනාශය
(d) බෝතල් මූඩි මොසැක් කලා හා අත්වැඩ
(e) ප්ලාස්ටික් අධිෂ්ඨාන
(f) ප්ලාස්ටික් කලාව
(g) ක්‍රියාවෙන් ඉගෙනීම

## සහයෝගීතාවය

- පදක්කම් පරීක්ෂකවරයාගේ හා පෝතක බාලදක්ෂ නායකයාගේ සහාය ඇතිව ( උපරිමය පෝතක බාලදක්ෂයන් 12-හයවල් 2) ගිත්වයෙන් පරිසරයට සම්බන්ධ ප්‍රජා සේවා තියක් ක්‍රියාත්මක කිරීම සෑම පොතක බාලදක්ෂයෙකුගේම දායකත්වය සේවා පැය 4ක් විය යුතුය.
- ඔබගේ ප්‍රදේශයේ විවිධ කණ්ඩායම්, ප්‍රජාව හා හවුල්කරුවන් සමඟ පාරිසරික ගැටළු හඳුනා ගැනීම.
- අනෙකුත් පෝතක බාලදක්ෂයන් සමඟ සුදුසු පිළියම් සොයා බැලීම.
- ප්‍රජා සේවා ව්‍යාපෘතියන් ක්‍රියාත්මක කිරීමට සැලසුමක් නිර්මාණය කිරීම.

## ක්‍රියාව

- එකඟ වූ සැලැස්ම ක්‍රියාවට නැංවීම
- ව්‍යාපෘතිය පිළිබඳ වාර්තාවක් පදක්කම් පරීක්ෂකට ඉදිරිපත් කිරීම
- එම ව්‍යාපෘතිය අඅඅගිප්ද්මළුගදරට වෙබ් අඩවිය වෙත පෝතක බාලදක්ෂ ආචාර්ය වරයාගේ සහාය ඇතිව උඩුගත කිරීම

## පදක්කම් ප්‍රදානය

අදාල දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශ සහිතව දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා විසින් ආදර්ශ පත්‍රිකාව ජාතික මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර ්ද් සම්බන්ධීකරණ විසින් පදක්කම සහ සහතික පත්‍රය නිකුත් කරනු ඇත. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා නොමැති විට සහාය දිසා කොම-සාරිස් (වැඩ සටහන්!) විසින් ආදර්ශ පත්‍රිකාව (වාර්තා) ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත භාර දිය යුතුය.

# සාමයේ සංවාදකරු
## *Dialogue for Peace*

1. රිදී තරුව දිනා ගැනීමෙන් පසුව දිනා ගත හැක

2. මෙහි සෑම පියවරකදීම පෝතක බාලදක්ෂයනා පදක්කම් පරීක්ෂක විසින් මග පෙන්වීම කළ යුතුය




**ඉගෙනීම**

පහත දැක්වෙන ඉගෙනීම් අරමුණු පහක් තෝරා ගෙන ඒවා පිළිබඳ පදක්කම් පරීක්ෂක වරයාගේ සහාය ඇතිව ඉගෙන ගැනීම (1 හා 2 අනිවාර්යයි)ද,

(1) සංවාදය මූලධර්ම හා දැනුම ඉදිරිපත් කිරීම
(2) මිනිසුන්ගේ විවිධත්වය හා සමානාත්වය පිලිබඳව වටහා ගැනීම
(3) මිනිසුන්ගේ විවිධත්වයට හේතු හා ඔවුන් එකිනෙකට උදව් කරන ආකාරය ගවේෂණය
(4) සමාජය තුළ මිනිසුන් අතර හා පවුල් ඇතුළත ඇති විවිධත්වය සොයා ගැනීම
(5) කම් යනුවෙනස් අව, වයන් සහ වෙනස් කෝණයකින් බැලීම තෝරාගැනීම් බව තේරුම් ගැනීම
(6) සමාජයේ මිනිසුන් අතර ඇතිවන සම්මත/ වරදවා වටහා ගැනීම් හේතුවෙන් ඇති වන අහිතකර විපාක පිළිබඳ අවධානය සෙවීම
(7) දරාගැනීමට අදාළ ප්‍රතිපත්ති හෝ එතෙතිහාසික සිද්ධීන් බෙදා හදා ගැනීම තුළින් සහජීවනයෙන් ජීවත්වීම පිළිබඳ උදාහරණ පෙන් වීම.
(8) සංවාදයන්ට සඳහා විවිධ ආරක්ෂාකාරී පරිසරයන් හඳුනාගැනීම
(9) සංවාද මගින් ඝට්ටන සහ මිනිසුන් අතර වැරදි වටහා ගැනීම් අවම කළහැකි බව පැහැදිලි කිරීම.

**කරන්න**
පදක්කම් පරික්ෂක වරයාගේ සහාය ඇතිව තෝරා ගැනීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය

(1) ඔබගේ ප්‍රදේශයේ සංවාද ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වීම. (විවාද/රැස්වීම් ආදිය)

(2) එකිනෙකට වෙනස් පුද්ගලයන් දෙදෙනකු අතර සංවාදයක් සූදානම් කිරීමට මූලිකත්වය ගැනීම

(3) ඝට්ටන වෙනුවට සංවාදයකින් ඇති වාසි පිළිබඳව ඔබගේ පෝතක රැළ වෙත ඉදිරිපත් කිරීම

# පෝතක බාලදක්ෂ නිල ඇඳුම (බාලිකා)



# පෝතක බාලදක්ෂ නිල ඇඳුම (බාලක)



# පෝතක බාලදක්ෂ ප්‍රගති පදක්කම් මාර්ගය

## රන් තරුව

අවශ්‍යතා 22
අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 3 කි.

## රිදී තරුව

අවශ්‍යතා 24
අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 2 කි.

## ලෝකඩ තරුව

අවශ්‍යතා 23
අනිවාර්ය ප්‍රවීණතා පදක්කම් 1 කි.

## සාමාජික පදක්කම

10 අවශ්‍යතා

**65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02**
Tel : 0115731050 / 0113231512 / 0112433131
e-mail :slscout1@yahoo.com / srilankascout@ymail.com
Web : www.scout.lk